# නිවේදනය A

පාර්ලිමේන්තුවේ 125 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධාන ප්‍රකාරව සම්බන්ධීකරණ කාරක සභාව : -

- කථානායකවරයාගේ සභාපතිත්වය ඇතිව;
- නියෝජ්‍ය කථානායකවරයා;
- නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා;
- පාර්ලිමේන්තුවේ සභානායකවරයා;
- පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා;
- ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා;
- විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා; සහ
- ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, උසස් නිලතල පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව යන කාරක සභාවල සභාපතිවරයන් ගෙන් සමන්විතව ම'විසින් පත්කරනු ලැබේ.